# 14. දෙව් වදන් පිළිපදිමු

**ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් අතර කන්ද උඩ දේශනයෙහි ඇති පණිවුඩය අපගේ ජීවිතවලට මහත් බලපෑමක් ඇතිකරයි. එම ඉගැන්වීම්වලින් කිහිපයක් ගැන දැන ගැනීම මෙම පාඩමින් අපේක්ෂිත ය.**

**ශු. මතෙව් 5:43-48, 6:5-15, 7:24-29**

## සතුරාට ප්‍රේම කිරීම

ශාන්ති - අද මොකද වේලාසනින් ම වැඩට යන්න ලෑස්ති වෙලා.

දමිත් - අා . .. ශාන්ති මට ඔයාට කියන්න බැරි වුණානේ කාරණයක්. අපේ වැඩපොළේ මට කරදර කරන සමරසේකරගේ දරුවා හොඳට ම අසනීපයෙන් ලු. මිනිහ ඉන්නෙ හොඳට ම හිතේ කරදරෙන්. හොඳ වැඩේ එයාට උණේ. මට හිතෙන්නෙ සමරසේකරට ටික කාලයකට වැඩට එන්න බැරිවේවි ගෙදර කරදර නිසා. මිනිහට ඔහොම වෙලා මදි මට කරන කරදර වලට.

ශාන්ති - අනේ පව් දමිත්. ඔයා ඇයි ඒ මනුස්සයාට කරදරයක් වුණා ම සතුටු වෙන්නේ. එයා ඔයාට හිරිහැරයක් වුණාට එයාට අවශ්‍ය උදව්වක් කරන එක තමයි ඔයා කරන්න ඕනේ. දරුවා බලන්න යන එක ඒ අය ගැන යාච්ඤා කරන එක මම හිතුවේ නැහැ ඔයා ඔච්චර නරක විදිහට මිනිස්සු ගැන හිතයි කියලා.

දමිත් - ඔයා දන්නේ නැහැනේ මගේ වැඩපළේ දේවල්. එතන ඉන්න අය බලන්නේ ලොක්කට කේලම් කියලා බොරු වැරදි පටවලා මාව අමාරුවේ දාන්න. ඒකට මුල්තැන ගත්තේ ඔය සමරසේකර තමා. මිනිහා නිසා මම හැමදාමත් එකම තනතුරේ රැඳිලා ඉන්නවා. මට පස්සේ ආපු අය ඉහළ තනතුරුවලට යන්නේ මට විරුද්ධව වැඩ කරලා

ශාන්ති - ඔයා ඊයේ පල්ලි ගිහිල්ලා දේශනයට ඇහුම්කන් දුන්නා නේ ද? මොකක්ද ජේසුස් වහන්සේ අපට කරන්න කියලා තියෙන්නේ, ? "ඔබේ සතුරාට ප්‍රේම කරන්න. ඔබට පීඩා කරන්නන් උදෙසා යාච්ඤා කරන්න කියලා නේ ද? ඒ නිසා ඔයත්, ඔයාට ඔය තියෙන ප්‍රශ්න කරදර ඉදිරියේ හොඳම දේ තමයි සතුරුකම් කරන අයට යාච්ඤා කරන එක. ඒ අයගේ සිත් වෙනස් කර දෙන්න කියලා ඔයා යාච්ඤා කරන්න.

දමිත් - ඔයත් මාව තේරුම් ගන්නේ නෑ ශාන්ති. මම කේන්තියෙන් ඉන්නේ මගේ වැඩපලේ දෙතුන් දෙනෙක් එක්ක විතරයි. ඔයා කියනවා වගේ මට ලොකු හතුරො නැහැ. මට උදව් කරන අය එක්ක මම හොඳින් ඉන්නවා. මට උදව් කරන අයට මමත් හරියට උදව් කරනවා.

ශාන්ති - බයිබලයේ ලියලා තියෙන්නේ, ඔයා ළඟින් ඉන්න, ඔයාට උදව් කරන ඔයාගෙ සහෝදරයන්ට පමණක් ප්‍රේම කරන්න කියල නෙමෙයි. ඔයාට සතුරුකම් කරනවා කියන අය සමග ප්‍රේමයෙන් ක්‍රියා කරන්න කියල යි. ඒ අයගෙ හිත් වෙනස් කරන්න කියලා ඔයා දෙවිඳුන්ට යාච්ඤා කරන්න. ඔයාගෙ ජීවිතේට අනිවාර්යයෙන් ම සහනයක් ලැබේවි. ඔයා අද වැඩට යන්න ඉස්සෙල්ලා මේ බයිබල් කොටස කියවලා යාච්ඤා කරලා යන්න.

**කියවා බලමු**
**ශු. මතෙව් 5:43-48**

**ඔබට සතුරුකම් කරන අය ලෙස ඔබ හඳුනා ගන්නේ කවරෙක් ද?**

- අපට පීඩාවක්, කරදරයක්, පාඩුවක් කරන අය ද ?
- අප පවුලට, ආගමට, ජාතියට අයත් නොවන අය ද ?
- අප සමග සිටිමින් අපට නොදැනෙන සේ, අප හිංසාවට පීඩාවට ලක් කරන අය ද ?
- අපගේ සිතුම් පැතුම්වලට, අදහස්වලට එකඟ නො වන අය ද ?
- අපට තිබෙන වත් පොහොසත්කම්වලට ඊර්ෂ්‍යා කරන අය ද ?

මෙලෙස අප, අපට කුමන අයුරකින් හෝ පීඩා කරන්නන් සතුරන් ලෙස සලකමු.


ජේසුස් වහන්සේ අපට මෙසේ වදාරන සේක

**"නුඹේ අසල්වැසියාට ප්‍රේම කරන්න, සතුරාට වෛර කරන්න යැයි කී බව ඔබ අසා තිබේ. එහෙත් මම ඔබට කියමි. "ඔබේ සතුරන්ට ප්‍රේම කරන්න. ඔබට පීඩා කරන්නන් උදෙසා යාච්ඤා කරන්න"**
**ශු. මතෙව් 5: 43-44**

ඔබට සතුරුකම් කරන අය උදෙසා කුමක් කළ යුතු ද?

- ❊ පීඩා කරන්නන් හඳුනාගෙන ඔවුන් උදෙසා යාච්ඤා කිරීම.
- ❊ සතුරාගෙන් පීඩා පැමිණෙන විට ඊට ප්‍රති විරුද්ධව ක්‍රියා නොකිරීම.
- ❊ සතුරාට ප්‍රේම කිරීමට අවශ්‍ය ශක්තිය ඉල්ලා යාච්ඤා කිරීම.
- ❊ පීඩා පැවතියත් යහපත් පැවැත්මෙන් යුතුව ක්‍රියා කිරීමට යොමු වීම.
- ❊ දේව දරුවන් ලෙස ලොවට ආදර්ශයක් වීම.
- ❊ සතුරාට ප්‍රේම කිරීම සාමාන්‍ය ජීවිතයේ අසීරු වුවත් එම අසීරු කාර්යය ඉටු කිරීම.

## යාච්ඤාව පිළිබඳ ඉගැන්වීම




ඔබ යාච්ඤා කළ යුතු නිවැරදි ස්වරූපය පිළිබඳ ව ජේසුස් වහන්සේ මෙසේ උගන්වන සේක.

- ❊ කෛරාටිකයන් මෙන් නො කරන්න.
- ❊ මිනිසුන්ට පෙනෙන ලෙස නොකර ඇතුළු කාමරයට වැද, දොර වසා, අදෘශ්‍යමානව වසන ඔබේ පියාණන් වහන්සේට යාච්ඤා කරන්න.
- ❊ දිගින් දිගට හිස් වචන නො දොඩන්න

**"ඔබ ඉල්ලන්නටත් පෙර ඔබේ වුවමනා කවරේදැයි
පියාණන්වහන්සේ දන්නා සේක"
ශු. මතෙව් 6: 8**

කිතුනු දරුවන් වන අප යාච්ඤා කළ යුතු ආකාරය ජේසුස් වහන්සේ මෙසේ ඉගැන්වූ සේක.

**ස්වර්ගයෙහි වැඩ වසන අපගේ පියාණෙනි,
ඔබ වහන්සේගේ නාමයට ගෞරව වේවා,
ඔබ වහන්සේගේ රාජ්‍ය පැමිණේවා.
ඔබ වහන්සේගේ කැමැත්ත ඉටුවේවා.
ස්වර්ගයෙහි මෙන් පොළොවෙහි ද එසේ ම වේවා,
අපගේ දවස් පතා ආහාරය අපට අද දුන මැනව,
අපට වරද කළ අයට අප කමා කලාක් මෙන් අපේ වරදට කමා වුව මැනව.
අප පරීක්ෂාවට නොපමුණුවා නපුරාගෙන් අප මිදුව මැනව
ශු. මතෙව් 6: 9-13**

ජේසුස් වහන්සේ ඉගැන්වූ යාච්ඤාව තුළ ඇති පොදු ලක්ෂණ නම් එහි **ඉල්ලීම් හා යුතුකම්** පවතින බවයි.

## ඉල්ලීම්

- ❈ අපගේ දවස්පතා භෝජනය
  දෙවියන් වහන්සේ අපගේ ශාරීරික හා ආත්මික අවශ්‍යතා සපයමින් අප පෝෂණය කරන සේක.

- ❈ අපගේ වරදට කමාව.
  අපට බොහෝ සේ ප්‍රේම කරන දෙවියන් වහන්සේ අපගේ වරදට කමාව ප්‍රදානය කරන සේක.

- ❈ පරීක්ෂාවට නොපමුණුවා නපුරාගෙන් අප මුදවා ගැනීම.
  සමාජයේ පවත්නා බොහෝ පරික්ෂාවන් ඉදිරියේ නොසැලී නිවැරදි දේ ක්‍රියාත්මක කිරීමට උන් වහන්සේ අපට ශක්තිය දෙන සේක.

ජේසුස් වහන්සේ ඉගැන්වූ යාච්ඤාවේ "ඉල්ලීම්" පිළිබඳව ඇති පොදු ලක්ෂණය වන්නේ ආත්මාර්ථකාමීව **'මා'** උදෙසා නොව පරාර්ථකාමීව **'අප'** උදෙසා ඉල්ලීමයි.

## කමාව ලැබීමට අපගේ යුතුකම

- ❈ අපට වරද කළ අයට අප කමා කළාක් මෙන් අපගේ වරදට කමාව හිමි වන බව.
  අපට වැරදි කරන අය උදෙසා අප කමාව ලබා දිය යුතු බව මින් පැහැදිලි ය. එසේ අප එකිනෙකාට කමා කරන කල අපගේ වරදට දෙවිඳුන්ගේ කමාව හිමි වේ.

අප **කමාව ලැබීමට** නම් **කමාව දීමට ද** සූදානම් විය යුතු බව මින් පැහැදිලි වේ. තමාට කමාව හිමිකර ගැනීමට තමාගේ ක්‍රියා කලාපය බෙහෙවින් ඉවහල් වන බවට කොන්දේසියක් ඉදිරිපත් කර ඇත.

# අත්තිවාරම් දෙක

**කියවා බලමු**
**ශු. මතෙව් 7:24-29**

ක්‍රිස්තියානි ජීවිතයේ පදනම ඇදහිල්ලයි. ඇදහිල්ල තුළ ශක්තිමත් වීමට කිතුනු දරුවන් වන අප දේව වචනය අධ්‍යයනය කළ යුතු වේ. ඒ අනුව තම ජීවිත හැඩගස්වා ගත යුතු වේ. තම ජීවිත ගමනේ දුකේ දී හා සැපේදී උන් වහන්සේ තුළ විශ්වාසයෙන් යුතුව රැඳී සිටීම වැදගත් වේ. විශේෂයෙන් දුක් කරදර මැද ජීවිතය ගතකරන මොහොතේ දී සමාජයේ විවිධ බාහිර බලපෑම්වලට ලක් වූවත්, නොසැලී දේව වචනය අනුව තම ජීවිතය හැඩගස්වා ගත යුතු බව ජේසුස් වහන්සේ මෙසේ වදාරන සේක.

**“එහෙයින් යමෙක් මාගේ වචන අසා ඒවා පිළිපදී ද,**
**ඔහු පර්වතය මත තමාගේ ගෙය තනාගත් නැණවතෙකුට සමාන ය.**
**වැසි වැස, ජලය ගලා, සුළඟ හමා ඒ ගෙට ගැසී ය.**
**එය පර්වතය මත පිහිටි බැවින් බිඳ නොවැටිණි”**
**ශු. මතෙව් 7: 24-25**

තවද ජේසුස් වහන්සේගේ වචනය අසන නමුත් ඒවා අමතක කොට ඊට ප්‍රතිවිරුද්ධව ක්‍රියාකොට ඇදහිල්ල බිඳ වැටෙන අය පිළිබඳව ජේසුස් වහන්සේ මෙසේ වදාරන සේක.

**“තවද යමෙක් මාගේ වචනය අසා, ඒවා නොපිළිපදී ද, ඔහු වැලි මත ගෙය තනා ගත් අනුවණ මනුෂ්‍යයෙකුට සමාන ය. වැසි වැස ජලය ගලා, සුළඟ හමා ඒ ගෙට ගැසී ය. එය බිඳ වැටුණි. එහි වැටීම ද භයංකාර ය”**
**ශු. මතෙව් 7: 26-27**

කිතුනු ඔබ පර්වතය මත ගෙයක් තැනූ නැණවතෙකුට සමාන විය යුතු වේ. දේව වචනය අසා එය පිළිපදින දරුවන් විය යුතු වේ. මන්ද දේව වචනය තුළ ජීවත් වීමෙන් අපගේ ජීවිත දෙවිඳුන් තුළ සවිමත් වන බැවිනි. ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් තුළ සවිමත් වන අප, එය තම ජීවිතයට අදාළ කර ගනිමින් දේව රාජ්‍යයේ වටිනාකම් පෙරදැරි කොට සදාචාරාත්මක සමාජයක් ගොඩ නැගීමට දායක වෙමු.

**ක්‍රියාකාරකම**

1. ඔබට පීඩා කරන අය උදෙසා යැදුමක් ලියන්න.
2. ඔබගේ පන්තියේ අවශ්‍යතා ඇති මිතුරෙකුට ඔබට කළ හැකි උපකාර 3 ක් ලියන්න.